පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය- භූගෝල විද්‍යාව

30 සතිය

7 ශ්‍රේණිය

Department of Education,Sabaragamuwa Province/ Weekly School Department of Education,Sabaragamuwa Province/ Weekly School

## 1 පාඩම අප ජීවත්වන පෘථිවි ගෝලය

■ පහත ප්‍රශ්නවලට නිවරැදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1.අතීතයේදී පෘථිවිය ............................ වස්තුවක් ලෙස සළකා ඇත
2.පෘථිවිය භ්‍රමණය වීමට ගත වන කාලය වන්නේ ............................ යි
3.පෘථිවිය පරිභ්‍රමණය වීමට ගත වන කාලය වන්නේ ............................ යි
4. ආදර්ශ ගෝලයේ මුළු දේශාංශ රේඛා ............................ ක් ඇත
5. පෘථිවිය මහද්වීප ............................ කින් සමන්විතය
6............................ ආසියා මහද්වීපය තුළ පිහිටා ඇති දූපතකි
7. ලෝකයේ විශාලම සාගරය ............................ සාගරයයි
8. ලෝකයේ කුඩාම මහද්වීපය ............................ මහද්වීපයයි
9. ජලයෙන් වට වූ කුඩා ගොඩබිමක් ............................ ලෙස හැඳින්වේ
10.සෘජු දේශාංශයක් නොවන දේශාංශය ............................ ලෙස හඳුන්වයි

■ පහත සඳහන් ප්‍රකාශ හරි නම් හරි ලකුණ ද වැරදි නම් වැරදි ලකුණ ද යොදන්න

11. මැඩගස්කර දූපත අප්‍රිකා මහද්වීපයට අයත්ය ( )
12. අප්‍රිකා මහද්වීපයේ විශාලත්වය වර්. කිලෝමීටර 8.9 කි( )
13. ජපන් මුහුද අභ්‍යන්තර මුහුදකි ( )
14. ආසියා මහද්වීපය තුළ රුසියාව පිහිටා ඇත ( )
15. පෘථිවියේ සමක පරිධිය කිලෝමීටර 40077කි ( )

■ පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

16. පෘථිවි භ්‍රමණය සහ පරිභ්‍රමණය හඳුන්වන්න
17. පෘථිවිය පූර්ණ ගෝලයක් නොවන්නේ ඇයි
18. අක්ෂාංශ හා දේශාංශ යන්න පැහැදිළි කරන්න
19. පෘථිවියේ මහද්වීප කීයද ඒවා නම් කරන්න
20. මහද්වීපවලට ආසන්නව පවතින මුහුදු 3ක් ලියන්න

## 2 පාඩම ශ්‍රී ලංකාවේ අනන්‍යතාව

■ පහත ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

1. ශ්‍රී ලංකාවේ සාපේක්ෂ පිහිටීම ලියන්න
2. ශ්‍රී ලංකාවේ නිරපේක්ෂ පිහිටීම ලියන්න
3. රාෂ්ටීය මුහුදු සීමාව යනු කුමක්ද
4. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භූ විෂමතා කලාප නම් කරන්න
5. එම කලාපවලට අයත් භූ විෂමතා ලක්ෂණ වෙන වෙනම ලියන්න
6. ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන ප්‍රධාන ක්‍රම තුන දක්වමින් ඒවා විස්තර කරන්න
7. ශ්‍රී ලාංකිකයන් සතු අස්පෘශ්‍ය උරුම ලියන්න
8. ස්පෘශ්‍ය නිර්මාණ බෙදෙන කොටස් දෙක නම් කරන්න
9.ශ්‍රී ලාංකික ජන සමාජයේ පවතින සංස්කෘතික උත්සව සහ සංස්කෘතිකාංග නම් කරන්න
10.ශ්‍රී ලංකාවේ දියුණු අධ්‍යාපනය හේතුවෙන් ඇතිව තිබෙන වාසි තුනක් ලියන්න

■ පහත ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න

1. දකුණු ආසියාතික රටවල් තුළින් ආයු අපේක්ෂාව වැඩිම රට ............................ යි
2. ශ්‍රී ලංකාවේ ළදරු මරණ අඩු වීමට ............................ වැඩි දියුණු වීම හේතු වී ඇත
3. ශ්‍රී ලංකාවේ සාක්ෂරතාව ............................% ක් වේ
4. දකුණු ආසියානු කලාපයේ රටවල් අතුරින් ඉහළ සමාජයීය සංවර්ධනයක් ඇති රටක් ලෙස ............................ සැලකිය හැකිය
5. සීගිරිය ............................ නිර්මිතයකි
6. ............................ ලෝක උරුමයක් ලෙස මධ්‍යම කඳුකරය දැක්විය හැකිය
7.ආදිවාසී ජනතාවගේ ජීවන මාර්ගයක් ලෙස ............................ දැක්විය හැකිය
8.දෙවුන්දර තුඩුව ............................ තැනිතලාව තුළ දැකගත හැකිය
9. ශ්‍රී ලංකාව ............................ කලාපය තුළ පිහිටි රටකි

10.ශ්‍රී ලංකාවේ මුළු වර්ග ප්‍රමාණය වර්ග කිලෝමීටර ............................ කි